# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


දේශබන්දු තෙන්නකෝන් මහතා, 2024.07.11
පොලිස්පති,
ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය,
කොළඹ 01

පොලිස්පතිතුමනි,

**<u>දඹුල්ල විහාර හන්දියේ ස්ථාපිත කර තිබූ එජාප මැතිවරණ ප්‍රචාරක කාර්යාලයකට පහර දීම.</u>**

2024.07.08 වන දින දඹුල්ල විහාර හන්දියේ දී විවෘත කිරීමට සැලසුම් කොට තිබූ එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රචාරක කාර්යාලයකට එදින අලුයම පැමිණි පිරිසක් විසින් බැනර් කටවුට් ආදිය කඩා බිඳ දමා අලාභහානි සිදුකොට ඇත.

නිදහස් හා සාධාරණ මැතිවරණයකට අදාල අනිකුත් තත්ත්වයන් ගැන කුමන විවේචනයන් පැවතියද මැතිවරණ කොමිෂන් සභාව, පොලිස් දෙපාර්තමේන්තුව සහ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඒකාබද්ධව ගන්නා ලද ප්‍රයත්නයන් හේතුවෙන් මේ වන විට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අවම මට්ටමකට ගෙන ඒමට සමත්ව ඇති අතර එකී තත්ත්වය ජනතා පරමාධිපත්‍ය පිළිබඳව සලකා බැලීමේදී සුවිශේෂී සංධිස්ථානයක් බව අමුතුවෙන් සඳහන් කල යුතු නොවේ.

කෙසේ නමුත් ජනාධිපතිවරණය පැවැත්වීමට අදාල මූලික කටයුතු සූදානම් වෙමින් පවතින වටපිටාවක එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ කාර්යාලයක් ඉලක්ක කරගනිමින් එල්ල කරන ලද ප්‍රහාරය සුළුකොට තැකිය යුත්තක් නොවන බව සඳහන් කරන අතර මෙවැනි ප්‍රචණ්ඩත්වයන් මුල් අවස්ථාවේදීම පාලනය කිරීමට අවැසි ක්ෂණික පියවර ගැනීම පොලිස් දෙපාර්තමේන්තුව සතු වගකීමක් බව අප අවධාරණය කරන්නෙමු. විශේෂයෙන්ම පසුගිය මැතිවරණ හා සැසඳීමේදී වඩාත් තරඟකාරී හා තීරණාත්මක මැතිවරණයක් බවට දේශපාලන විශ්ලේෂකයන් පවසන ඉදිරි ජනාධිපතිවරණයේදී මැතිවරණ ප්‍රචණ්ඩත්වයන් වැඩි වශයෙන් සිදුවීමට තිබෙන අවධානමද බැහැර නොකල යුත්තකි.

නියපොත්තෙන් කඩන්නට තිබෙන දේ පොරවෙන් කපන්නට එපා යැයි ප්‍රසිද්ධ කියමනක් වෙයි. එනයින් බලන කල මෙවැනි ප්‍රචණ්ඩත්වයන් ලත්තැනම ලොප් කරමින් කිසිදු බලපෑමකින් තොරව ඡන්දදායකයින්ට සිය පරමාධිපත්‍ය බලය අභ්‍යාස කිරීමට අවැසි පරිසරය නිර්මාණය කිරීම අප සියල්ලගේම වගකීමකි.

උක්ත කරුණ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කොට අදාල ප්‍රචාරක කාර්යාලයට පහරදීමට පැමිණි පිරිස හඳුනාගෙන අවැසි කඩිනම් නෛතික පියවර ගනිමින් ඉදිරි මැතිවරණය ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී මැතිවරණයක් බවට පත්කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ඉතා කාරුණිකව ඉල්ලමි.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.

Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572

Email : paffrel@sltnet.lk Web : www.paffrel.com